# සටහන

2017 ජූලි - අගෝස්තු වෙළුම 36 7 - 8 කලාපය

## අලුත් බඩු මල්ලක්

(ජාතික පාරිභෝගික මිල දර්ශකය)




2 භූතානයේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්

3 ජාතික පාරිභෝගික මිල දර්ශකය පිළිබඳ හැඳින්වීමක්

10 මූලික උද්ධමනය, එහි වැදගත්කම සහ ගණනය කිරීමේ විවිධ ක්‍රම

15 ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ආදායම් දරිද්‍රතා දර්ශකය සංසන්දනය


ISSN 1391-3697


රු. 20/-

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# භූතානය

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...



## භූතානය

නැගෙනහිර හිමාලය ආශ්‍රිත ව පිහිටි භූතානය සෑම දිසාවකින් ම ගොඩබිමින් වට වූ දකුණු ආසියාතික රාජ්‍යයක්. උතුරින් තිබ්බතයෙන් ද අනිකුත් දිසාවන් ඉන්දියානු උප මහද්වීපයෙන් ද වට වී ඇති භූතානය එ රට වැසියන් හඳුන්වන්නේ "මකර දේශය" නමින්. ඓතිහාසික සේද මාවතේ පිහිටි මේ රාජ්‍යය කිසිදා යටත් විජිතයක් නොවී ස්වාධීන ලෙස පැවතුණා. දකුණු ආසියාතික රටවල් අතර ආර්ථික වශයෙන් සමෘද්ධිමත් රටක් වන මෙය කලාපයේ අනෙක් දියුණු වන රටවලට ආදර්ශයක් ලෙස ගත හැකි බව බොහෝ ආර්ථික විශ්ලේෂකයන්ගේ මතයයි. "දළ ජාතික සන්තුෂ්ටිය" (Gross National Happiness) සංකල්පය ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී රටක් වන භූතානය ආර්ථික නිදහස, ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව සහ සාමකාමී වාතාවරණය අතින් දකුණු ආසියාතික රටවල් අතර ප්‍රමුඛ ස්ථානයක සිටිනවා. ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් සහිත භූතානය එක්සත් ජාතීන්, සාර්ක්, බිම්සටෙක් සහ නොබැඳි ජාතීන් යන සංවිධානවල සාමාජිකත්වය දරනවා.

| | |
|---|---|
| භූමි ප්‍රමාණය | |
| මුළු ප්‍රමාණය | වර්ග කි.මී. 160 |
| ගොඩ බිම් ප්‍රමාණය | වර්ග කි.මී. 160 |
| අභ්‍යන්තර ජලාශ | වර්ග කි.මී. 0 |
| ජනගහනය (2016 ජූලි ඇස්තමේන්තු) | 750,125 |
| ජනගහන වර්ධන වේගය (2016 ඇස්තමේන්තු) | 1.09% |
| උපත් අනුපාතය (2016 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 17.5 |
| මරණ අනුපාතය (2016 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 6.6 |
| උපතේදී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2016 ඇස්තමේන්තු) | 70.1 |
| ළදරු මරණ අනුපාතය (2016 ඇස්තමේන්තු) (සජීවී උපත් දහසකට) | 33.9 |
| සේවා වියුක්තිය (2015 ඇස්තමේන්තු) | 2.5% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2012) | 38.8 |
| ශ්‍රම බලකාය (2015 ඇස්තමේන්තු) | 353,000 |
| දළ දේශීය නිෂ්පාදිතය (2016 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් මිලියන 6.432 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (2016 ඇස්තමේන්තු) | 6% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2016 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 8,100 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය | |
| කෘෂිකර්මය | 16.4% |
| කර්මාන්ත | 42.1% |
| සේවා (2016 ඇස්තමේන්තු) | 41.5% |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (2016 ඇස්තමේන්තු) | -3% |
| උද්ධමන අනුපාතය (2016 ඇස්තමේන්තු) | 2.9% |
| ආනයන (2016 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 1.1 |
| ආනයන භාණ්ඩ | ඉන්ධන, ගුවන්යානා, යන්ත්‍රෝපකරණ හා කොටස්, සහල්, මෝටර් රථ |
| අපනයන (2016 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් මිලියන 500 |
| අපනයන භාණ්ඩ | විදුලිය (ඉන්දියාවට), ෆෙරෝසිලිකන්, සිමෙන්ති, කරාබුනැටි, කැල්සියම් කාබයිට්, යකඩ බට, ඩොලමයිට්, ජිප්සම් |

**මෙම කලාපයේ ලිපි සමාලෝචනය**
පී.ඩබ්.බී.එන්.ආර්. රොද්‍රිගෝ මයා - අධ්‍යක්ෂ දේශීය කටයුතු දෙපාර්තමේන්තුව
ආචාර්ය එච්.කේ.ජේ. ඒකනායක මිය - ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ආචාර්ය ටී.එම්.ආර්.පී. යටිගම්මන මිය - ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

සටහන

"ශ්‍රී ලංකා මහ බැංකුව" නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 480.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

36 වෙළුම 7-8 කලාපය 2017 ජුලි - අගෝස්තු ISSN 1391-3697 වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# ජාතික පාරිභෝගික මිල දර්ශකය පිළිබඳ හැඳින්වීමක්

**බී. එන්. කේ. ප්‍රනාන්දු**
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජාතික පාරිභෝගික මිල දර්ශකය නමින් නවතම පාරිභෝගික මිල දර්ශකයක් 2015 නොවැම්බර් 23 දින සිට ප්‍රකාශයට පත් කර ඇත. ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී එම තීරණවල කාර්යක්ෂමතාව ඉහළ දැමීමට ජාතික දර්ශකයක අවශ්‍යතාවක් ඇති විය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික දත්ත තවදුරටත් වැඩිදියුණු කරමින් මෙම නවතම ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) හඳුන්වා දී ඇත. ගෘහ ඒකකයන්ගේ පරිභෝජන රටාවේ වෙනස්වීම් පිළිබිඹු වන අයුරින් පාරිභෝගික මිල දර්ශකයේ බර තැබීම් වසර 5කට වරක්වත් සිදු කළ යුතු බව ජාත්‍යන්තර ක්‍රමවේදයේ පිළිගැනීමයි.

නව ජාතික පාරිභෝගික මිල දර්ශක (පදනම 2013 = 100) සඳහා බර තැබීමේ ව්‍යුහය 2012 ජූලි මස සිට 2013 ජූනි යන මාස 12 තුළ දී දිවයින පුරා සිදු කරන ලද ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණයෙන් (2012/2013) ලබාගත් තොරතුරු පදනම් වේ. මේ සඳහා පළාත් නවය ම ආවරණය වන පරිදි ගෘහ ඒකක 20,540ක් යොදා ගෙන ඇත. මීට ගෘහ ඒකකයක් සිදු කරන සියලු ම වියදම් අඩංගු වන අතර ම ඒ තොරතුරු හරහා රටේ සෑම ගෘහ කාණ්ඩයක් ම නියෝජනය වේ. මෙම ජාතික පාරිභෝගික මිල දර්ශකයේ පදනම් කාලය ලෙස 2013 ජනවාරි සිට 2013 දෙසැම්බර් මාසය ලෙස ගෙන ඇත. එනම් පදනම් වර්ෂය ලෙස 2013 වර්ෂය සලකා ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම ලැස්පියර්ස් සූත්‍රය භාවිත කළ අතර නවතම ජාතික පාරිභෝගික මිල දර්ශකය ගණනය සඳහා වැඩිදියුණු කරන ලද ලැස්පියර්ස් සූත්‍රය භාවිතා කරයි. පදනම් වර්ෂය 2013 ලෙස ගෙන මෙම දර්ශකයේ මාසික සාමාන්‍ය ගෘහ පරිභෝජන වියදම් ලෙස රු.32,142.69 ක් වන අතර දර්ශක ඒකකයක වටිනාකම රු.321.42 (රු.32,142.69/100) ක් වේ.

ශ්‍රී ලංකාවේ උද්ධමනය මනිනු ලබන නිල මිල දර්ශකයක් ලෙස කොළඹ පාරිභෝගික මිල දර්ශකය (1952=100) භාවිත කරන ලදී. 1949/1950 කාලයේ කොළඹ නාගරික සීමාව තුළ පැවැත්වූ පවුල් අයවැය සමීක්ෂණයෙන් වැටුප් ලබන සේවකයන් හා ලිපිකරුවන් ඇතුළත් වූ වැඩ කරන පංතියේ පවුල් 455 ක් ආවරණය වූ අතර එම සමීක්ෂණය මගින් ලබාගත් පාරිභෝගික දත්ත මගින් මෙම කොළඹ පාරිභෝගික මිල දර්ශකයට බර තැබුම හෙවත් ඒ ඒ භාණ්ඩ හා සේවාවල වැදගත්කම තීරණය කොට ඇත. මෙම කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පදනම් වර්ෂය ලෙස 1952 සලකා ඇත. මෙම පැරණි කොළඹ පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීම 2008 මැයි මස සිට අත්හිටුවා ඇත. කොළඹ පාරිභෝගික මිල දර්ශක හි පවත්නා දුර්වලතා ඉවත් කොට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මෙම පැරණි කොළඹ පාරිභෝගික මිල දර්ශක හි

අඩුපාඩු සැලකිල්ලට ගනිමින් 2002 වර්ෂයේ පවත්වන ලද ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ (HIES) තොරතුරු පදනම් කොට ගනිමින් නව පාරිභෝගික මිල දර්ශකයක් 2007 නොවැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කොට ඇත. 2002 ජනවාරි-දෙසැම්බර් දක්වා කාලය පදනම් වර්ෂය ලෙස සලකා එම කාල සීමාව තුළ මෙම දර්ශකයේ (පදනම 2002=100) භාණ්ඩ හා සේවා සඳහා වූ මාසික පරිභෝජන වියදම රු.17,996.38 ක් වූ අතර පැරණි කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (පදනම 1952 = 100) මුළු පරිභෝජන වියදම රු.202 හා සාපේක්ෂ ව සැසඳීමේ දී 88 ගුණයක වැඩිවීමකි. මෙම වැඩිවීම හරහා ආදායම් සහ මිල මට්ටම් වැඩිවීම සහ භාණ්ඩ පැසෙහි සිදු වී ඇති වෙනස්වීම් පෙන්නුම් කරයි. තවදුරටත් මිල මට්ටම්හි සමස්ත වෙනස්වීම් පිළිබිඹු වන අයුරින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2011 ජුනි මස සිට කොළඹ පාරිභෝගික මිල දර්ශක (පදනම 2006/2007 = 100) හි නව ශ්‍රේණියක් ප්‍රකාශයට පත් කරන ලදී. 2006 ජනවාරි සිට 2007 දෙසැම්බර් දක්වා වූ කාලය පාද වර්ෂය ලෙස සලකා ඇත. තවද 2006/2007 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය පදනම් කරගෙන සැකසූ කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (පදනම 2006/2007 = 100) භාණ්ඩ හා සේවා සඳහා මාසික පරිභෝජන වියදම රු.27,972.11 ක් විය. මෙය පෙර පැවති කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2002 = 100) හා සැසඳීමේ දී 55.4% ක වැඩිවීමකි. අලුතින් හඳුන්වා දුන් ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මුළු මාසික පරිභෝජන වියදමෙහි වැඩිවීම 2006/07 පාද වර්ෂය ලෙස ගණනය කරනු ලැබූ කො. පා. මි. ද.යෙහි පරිභෝජන වියදම වූ රුපියල් 27,972.11 හා සාපේක්ෂව බැලීමේ දී සියයට 14.9 ක වැඩිවීමකි.

කොළඹ පාරිභෝගික මිල දර්ශක (2006/07=100) ගණනය කිරීම සඳහා කොළඹ නාගරික සීමාව තුළ පිහිටි මධ්‍යස්ථාන 14 කින් භාණ්ඩ පැස සඳහා මිල ගණන් රැස් කරයි. එම භාණ්ඩ පැස තුළ අයිතම 373 ක් අඩංගු විය. නමුත් ජාතික පාරිභෝගික මිල දර්ශකය සඳහා යොදාගන්නා ජාතික පාරිභෝගික මිල දර්ශකයේ භාණ්ඩ පැස තුළ අයිතම 407 ක් අඩංගු අතර එමගින් පාරිභෝගිකයාගේ වියදම් රටාව තවදුරටත් හොඳින් පෙන්නුම් කරනු ඇත. ජාතික පාරිභෝගික මිල දර්ශකය අදාළ ලිත් මාසය අවසන් වී දින 21 කට පසු ප්‍රකාශයට පත් කරයි. එනම් ජාතික පාරිභෝගික මිල දර්ශකය 2015 ඔක්තෝබර් මාසය සඳහා නොවැම්බර් මස 23 දින ප්‍රථම ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මෙම නව ජාතික පාරිභෝගික මිල දර්ශක මගින් ශ්‍රී ලංකාවේ පළාත් නවයම ආවරණය වන අතර සෑම දිස්ත්‍රික්කයක ම ප්‍රධාන නගරවල මිල රැස් කරන මධ්‍යස්ථාන 3කින් භාණ්ඩ පැස තුළ ඇති සෑම අයිතමයක් සඳහා ම මිල ගණන් රැස් කරනු ලබයි. තවද මෙම මිල ගණන් භාණ්ඩ පැස තුළ ඇති අයිතම වර්ග අනුව සතිපතා, මාසයකට දෙවරක්, මාසිකව හා කාර්තුමය වශයෙන් දත්ත එකතු කරනු ලබයි.

උදාහරණ වශයෙන්,

| කාලය | අයිතම |
|---|---|
| සතිපතා | නැවුම් මාලු, සහල් වර්ග, පළතුරු, එළවළු, පොල් |
| මාසයකට දෙවරක් | කරවල, කුළුබඩු, පලාවර්ග, මස් වර්ග, පිළියෙළ කරන ලද ආහාර |
| මාසික ව | නිමි ඇඳුම්, රෙදි සෝදන සබන්, රෙදි සෝදන කුඩු, ඇඳ රෙදි, තිර රෙදි, මත්පැන්, දුම්කොළ, බුලත්, පුවක් |
| කාර්තුමය | මුළුතැන්ගෙයි උපකරණ, ගෘහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය, ඖෂධ, අධ්‍යාපන කටයුතු සේවා, ප්‍රවාහන සේවා ගාස්තු, සෞඛ්‍ය සේවා ගාස්තු |

ජාත්‍යන්තර සම්මත ක්‍රමවේදයන්ට අනුකූලව ජාතික පාරිභෝගික මිල දර්ශක සකස් කොට ඇත. අන්තර්ජාතික සම්මත වර්ගීකරණය අනුව ජාතික පාරිභෝගික මිල දර්ශක සකස් කිරීමට ගන්නා භාණ්ඩ පැස තුළ ප්‍රධාන කාණ්ඩ 12 ක් ඇත. එම කාණ්ඩ 12 නම්,

1. ආහාර සහ මත්පැන් නො වන බීම
2. මත්පැන්, සහ දුම්කොළ
3. රෙදිපිළි හා පාවහන්
4. නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන
5. ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු
6. සෞඛ්‍ය
7. ප්‍රවාහන
8. සන්නිවේදන

9. සංස්කෘතික හා විනෝදාත්මක
10. අධ්‍යාපන
11. ආපනශාලා සහ හෝටල්
12. විවිධ භාණ්ඩ හා සේවා වේ.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ජාත්‍යන්තර සම්මත ක්‍රමවේදයන්ට අනුකූල ව වාහන රක්ෂණ ගාස්තු විවිධ භාණ්ඩ හා සේවා කාණ්ඩයට වැටෙන අතර කොළඹ පාරිභෝගික මිල දර්ශක (2006/07) හිදි ප්‍රවාහන කාණ්ඩයට රක්ෂණ

සංඛ්‍යා සටහන 1 මගින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය (1952=100), කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2002=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2006/07 =100) හි අතර පැවති ප්‍රධාන වෙනස්කම් කිහිපයක් ලුහුඬින් දක්වා ඇත.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ හා ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ඇති වැදගත් ලක්ෂණ කිහිපයක් කෙටියෙන් සංඛ්‍යා සටහන 2 හි දක්වා ඇත.

**සංඛ්‍යා සටහන 1**

**කොළඹ පාරිභෝගික මිල දර්ශක (1952 = 100) යේ කොළඹ පාරිභෝගික මිල දර්ශක (2002 = 100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශක (2006/07 =100) අතර ප්‍රධාන වෙනස්කම්**

| අංශ | | කො.පා.මි.ද. (1952 = 100) | කො.පා.මි. ද. (2002 = 100) | කො.පා.මි.ද. (2006/07= 100) |
|---|---|---|---|---|
| 1. | ප්‍රධාන කාණ්ඩ | 05 | 10 | 10 |
| 2. | උප කාණ්ඩ | 38 | 83 | 95 |
| 3 | පදනම් වර්ෂය | 1952 | 2002 | 2006/2007 |
| 4. | භුගෝලීය ආවරණය | කොළඹ නාගරික සීමා | කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශ | කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශ |
| 5. | ඉලක්කගත ජනගහනය | සීමිතයි (වැඩ කරන පංතිය) | කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල ගෘහ ඒකක | කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල ගෘහ ඒකක |
| 6. | ගෘහ ඒකකවල සාමාන්‍ය අගය | 5.8 | 4.5 | 4.4 |
| 7. | මිල ගණන් රැස්කරන මධ්‍යස්ථාන | 07 | 12 | 14 |
| 8. | මාසික පරිභෝජන වියදම්වල සාමාන්‍ය අගය | රු. 202.24 | රු. 17,996.38 | රු. 27,972.11 |
| 9. | මුළු අයිතම | 213 | 334 | 373 |
| 10. | නියැදියේ විශාලත්වය | 455 ගෘහ ඒකක | 1300 ගෘහ ඒකක | 21,790 ගෘහ ඒකක |
| 11. | බර තැබුම අනුව<br>1. ආහාර<br>2. ආහාර නොවන | <br>68.3<br>31.7 | <br>46.7<br>53.3 | <br>41.03<br>58.97 |

මූලාශ්‍ර: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ගාස්තු සහ ආදායම් බලපත්‍ර ගාස්තු අඩංගු වී ඇත. තවද කොළඹ පාරිභෝගික මිල දර්ශකය (පදනම 2006/07 = 100) තුළ මත්පැන්, දුම්කොළ හා මත්ද්‍රව්‍ය යන දෙවන කාණ්ඩය අඩංගු නො වන අතර ආපනශාලා හා හෝටල් යන කාණ්ඩයන් ආහාර කාණ්ඩවල උප කාණ්ඩයක් ලෙස අන්තර්ගත වේ.

බර තැබුම අනුව සංසන්දනාත්මකව කොළඹ පාරිභෝගක දර්ශක හා ජාතික පාරිභෝගික මිල දර්ශකය පහත වගුවේ දක්වා ඇත.

රූප සටහන 1 මගින් උද්ධමනය මනිනු ලබන එක් මිනුමක් වන ලක්ෂ්‍යමය පදනම මත එනම් සලකන

**සංඛ්‍යා සටහන 2**
**කොළඹ පාරිභෝගික**
**මිල දර්ශක හා ජා.පා.මි.ද. යේ වැදගත් ලක්ෂණ**

| අංශ | | කො.පා.මි.ද. (2006/2007 = 100) | ජා.පා.මි. ද. (2013 = 100) |
|---|---|---|---|
| 1. | ප්‍රධාන කාණ්ඩ | 10 | 12 |
| 2. | උප කාණ්ඩ | 95 | 105 |
| 3. | පදනම් වර්ෂය | 2006/07 | 2013 |
| 4. | භූගෝලීය ආවරණය | කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශ | ශ්‍රී ලංකාව තුළ ඇති පළාත් නවය ම |
| 5. | ඉලක්කගත ජනගහන ඒකක | කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල ගෘහ ඒකක | එක් එක් පළාත්වල සිටින ගෘහ ඒකක |
| 6. | ගෘහ ඒකකවල සාමාන්‍ය අගය | 4.4 | 3.9 |
| 7. | මිල ගණන් රැස්කරන මධ්‍යස්ථාන | 14 | සෑම දිස්ත්‍රික්කයකම වූ නගරවල මධ්‍යස්ථාන 3 කින් |
| 8. | මාසික පරිභෝජන වියදම්වල සාමාන්‍ය අගය | රු.27,972.11 | රු. 32,142.69 |
| 9. | මුළු අයිතම | 373 | 407 |
| 10. | මුළු බර තැබුමෙන් ප්‍රතිශතයක් ලෙස<br>1. ආහාර<br>2. ආහාර නොවන | <br>41.03<br>58.97 | <br>44.04<br>55.96 |

මාසයේ මිල දර්ශකයේ සහ පසුගිය වර්ෂයේ ඊට අනුරූප මාසයට සාපේක්ෂ ව සිදු වූ ප්‍රතිශතාත්මක වෙනසත්, වාර්ෂික සාමාන්‍ය පදනම මත එනම් සලකනු ලබන මාසය ඇතුළත් මාස 12 ක මිල දර්ශකවල සාමාන්‍ය

**සංඛ්‍යා සටහන 3**
**කොළඹ පාරිභෝගික**
**මිල දර්ශක හා ජා.පා.මි.ද. යේ බර තැබුම අනුව සංසන්දනය**


| ප්‍රධාන කාණ්ඩ | | කො.පා.මි.ද. (2006/07 = 100) බර තැබුම අනුව % | ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) බර තැබුම අනුව % |
|---|---|---|---|
| 1. | සියලු ම අයිතම සඳහා<br>ආහාර සහ මත්පැන් නොවන බීම | 100.00<br>41.03 | 100.00<br>44.04 |
| 2. | මත්පැන්, දුම්කොළ හා මත්ද්‍රව්‍ය | - | 2.27 |
| 3. | රෙදිපිළි හා පාවහන් | 3.14 | 3.44 |
| 4. | නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන | 23.72 | 18.00 |
| 5. | ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු | 3.60 | 3.30 |
| 6. | සෞඛ්‍ය | 3.16 | 4.05 |
| 7. | ප්‍රවාහන | 12.26 | 9.75 |
| 8. | සන්නිවේදන | 4.75 | 2.32 |
| 9. | සංස්කෘතික හා විනෝදාත්මක | 1.50 | 1.59 |
| 10. | අධ්‍යාපන | 3.94 | 2.81 |
| 11. | ආපනශාලා සහ හෝටල් | - | 3.90 |
| 12. | විවිධ භාණ්ඩ හා සේවා | 2.84 | 4.53 |


අතර ප්‍රතිශතාත්මක වෙනසත් ජාතික පාරිභෝගික මිල දර්ශක අනුසාරයෙන් දක්වා ඇත.

රූප සටහන 1 මගින් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනයත් වාර්ෂික සාමාන්‍යය මත උද්ධමනයත් නිරූපණය කොට ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) සඳහා අන්තර්ජාතික සම්මත වර්ගීකරණයන්ට අනුව තනි පුද්ගල පරිභෝජන වර්ගීකරණයේ අරමුණු (Classification of Individual Consumption by Purpose - COICOP) අනුව ඒ ඒ අයිතමවලට කේතන ඉදිරිපත් කර ඇත. දැනට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2014 ජනවාරි සිට 2017 ජුලි දක්වා ප්‍රකාශිත ජාතික පාරිභෝගික මිල (2013 = 100) දර්ශකයේ සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ විචලනයන් ඇමුණුම 1, 2 මගින් ඉදිරිපත් කර ඇත.

රූප සටහන 1



විමර්ශිත කෘති

1. වාර්ෂික වාර්තාව 2014 සහ 2015 : ශ්‍රී ලංකා මහ බැංකුව
2. http: //www.statistics.gov.lk
3. http://www.statistics.gov.lk/price/NCPI/NCPI%20Tecnical%20% 20Note.pdf
4. වාර්ෂික වාර්තාව 2006, 2008 සහ 2009 ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව.
5. Measurement of Inflation: New Colombo Consumer's Price Index (CCPI) - Economic Review: January 2009


ඇමුණුම 1

### ජාතික පාරිභෝගික මිල දර්ශකයේ හැසිරීම
### පදනම : 2013 = 100

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | උද්ධමනය | |
|---|---|---|---|---|---|
| | | | | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % |
| 2014 | ජනවාරි | 103.1 | | | |
| | පෙබරවාරි | 103.0 | -0.1% | | |
| | මාර්තු | 103.2 | 0.2% | | |
| | අප්‍රේල් | 104.1 | 0.9% | | |
| | මැයි | 104.9 | 0.8% | | |
| | ජූනි | 106.2 | 1.2% | | |
| | ජූලි | 107.0 | 0.8% | | |
| | අගෝස්තු | 106.4 | -0.6% | | |
| | සැප්තැම්බර් | 106.4 | 0.0% | | |
| | ඔක්තෝබර් | 106.0 | -0.4% | | |
| | නොවැම්බර් | 106.9 | 0.8% | | |
| | දෙසැම්බර් | 108.6 | 1.6% | | |
| 2015 | ජනවාරි | 112.8 | 3.9% | 9.4% | |
| | පෙබරවාරි | 108.9 | -3.5% | 5.7% | |
| | මාර්තු | 107.6 | -1.2% | 4.3% | |
| | අප්‍රේල් | 107.0 | -0.6% | 2.8% | |
| | මැයි | 108.0 | 0.9% | 3.0% | |
| | ජූනි | 109.1 | 1.0% | 2.7% | |
| | ජූලි | 108.9 | -0.2% | 1.8% | |
| | අගෝස්තු | 108.4 | -0.5% | 1.9% | |
| | සැප්තැම්බර් | 108.4 | 0.0% | 1.9% | |
| | ඔක්තෝබර් | 109.2 | 0.7% | 3.0% | |
| | නොවැම්බර් | 112.0 | 2.6% | 4.8% | |
| | දෙසැම්බර් | 113.2 | 1.1% | 4.2% | 3.8% |
| 2016 | ජනවාරි | 112.0 | -1.1% | -0.7% | 2.9% |
| | පෙබරවාරි | 110.8 | -1.1% | 1.7% | 2.6% |
| | මාර්තු | 110.0 | -0.7% | 2.2% | 2.4% |
| | අප්‍රේල් | 111.6 | 1.5% | 4.3% | 2.6% |
| | මැයි | 113.7 | 1.9% | 5.3% | 2.7% |
| | ජූනි | 116.1 | 2.1% | 6.4% | 3.1% |
| | ජූලි | 115.2 | -0.8% | 5.8% | 3.4% |

මූලාශ්‍ර: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඇමුණුම 2

### කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ හැසිරීම
### පදනම : 2006/07 = 100

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | උද්ධමනය | |
|---|---|---|---|---|---|
| | | | | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % |
| 2009 | ජනවාරි | 131.1 | -0.1% | 10.4% | |
| | පෙබරවාරි | 131.2 | 0.1% | 7.5% | |
| | මාර්තු | 130.5 | -0.6% | 5.3% | |
| | අප්‍රේල් | 129.6 | -0.7% | 2.6% | |
| | මැයි | 132.6 | 2.3% | 3.6% | |
| | ජූනි | 134.3 | 1.3% | 0.7% | |
| | ජූලි | 135.2 | 0.7% | 1.2% | |
| | අගෝස්තු | 134.7 | -0.3% | 1.0% | |
| | සැප්තැම්බර් | 134.9 | 0.1% | 1.0% | |
| | ඔක්තෝබර් | 135.3 | 0.3% | 1.5% | |
| | නොවැම්බර් | 136.3 | 0.7% | 2.9% | |
| | දෙසැම්බර් | 137.8 | 1.1% | 5.0% | |
| 2010 | ජනවාරි | 140.4 | 1.9% | 7.1% | 3.2% |
| | පෙබරවාරි | 141.1 | 0.5% | 7.5% | 3.3% |
| | මාර්තු | 139.8 | -0.9% | 7.2% | 3.4% |
| | අප්‍රේල් | 138.4 | -1.0% | 6.8% | 3.8% |
| | මැයි | 140.1 | 1.2% | 5.6% | 3.9% |
| | ජූනි | 141.2 | 0.8% | 5.1% | 4.3% |
| | ජූලි | 141.2 | 0.0% | 4.4% | 4.6% |
| | අගෝස්තු | 141.4 | 0.2% | 5.0% | 4.9% |
| | සැප්තැම්බර් | 142.6 | 0.8% | 5.7% | 5.3% |
| | ඔක්තෝබර් | 144.1 | 1.1% | 6.5% | 5.7% |
| | නොවැම්බර් | 145.7 | 1.1% | 6.9% | 6.1% |
| | දෙසැම්බර් | 147.2 | 1.1% | 6.8% | 6.2% |
| 2011 | ජනවාරි | 149.2 | 1.4% | 6.2% | 6.1% |
| | පෙබරවාරි | 151.3 | 1.4% | 7.2% | 6.1% |
| | මාර්තු | 150.6 | -0.5% | 7.7% | 6.2% |
| | අප්‍රේල් | 150.6 | 0.1% | 8.9% | 6.4% |
| | මැයි | 151.5 | 0.6% | 8.2% | 6.6% |
| | ජූනි | 151.2 | -0.2% | 7.1% | 6.7% |
| | ජූලි | 151.7 | 0.4% | 7.5% | 7.0% |
| | අගෝස්තු | 151.3 | -0.3% | 7.0% | 7.1% |
| | සැප්තැම්බර් | 151.7 | 0.3% | 6.4% | 7.2% |
| | ඔක්තෝබර් | 151.5 | -0.1% | 5.1% | 7.1% |
| | නොවැම්බර් | 152.6 | 0.7% | 4.7% | 6.9% |
| | දෙසැම්බර් | 154.4 | 1.2% | 4.9% | 6.7% |
| 2012 | ජනවාරි | 154.8 | 0.3% | 3.8% | 6.5% |
| | පෙබරවාරි | 155.4 | 0.4% | 2.7% | 6.1% |
| | මාර්තු | 158.8 | 2.2% | 5.5% | 5.9% |
| | අප්‍රේල් | 159.8 | 0.6% | 6.1% | 5.7% |
| | මැයි | 162.1 | 1.4% | 7.0% | 5.6% |
| | ජූනි | 165.2 | 1.9% | 9.3% | 5.8% |
| | ජූලි | 166.7 | 0.9% | 9.8% | 6.0% |
| | අගෝස්තු | 165.7 | -0.6% | 9.5% | 6.3% |
| | සැප්තැම්බර් | 165.5 | -0.1% | 9.1% | 6.5% |
| | ඔක්තෝබර් | 165.0 | -0.3% | 8.9% | 6.8% |
| | නොවැම්බර් | 167.1 | 1.3% | 9.5% | 7.2% |
| | දෙසැම්බර් | 168.6 | 0.9% | 9.2% | 7.6% |

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | උද්ධමනය | |
|---|---|---|---|---|---|
| | | | | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % |
| 2013 | ජනවාරි | 170.0 | 0.8% | 9.8% | 8.1% |
| | පෙබරවාරි | 170.7 | 0.4% | 9.8% | 8.6% |
| | මාර්තු | 170.8 | 0.1% | 7.5% | 8.8% |
| | අප්‍රේල් | 170.0 | -0.5% | 6.4% | 8.8% |
| | මැයි | 173.9 | 2.3% | 7.3% | 8.8% |
| | ජූනි | 176.5 | 1.5% | 6.8% | 8.6% |
| | ජූලි | 176.8 | 0.2% | 6.1% | 8.3% |
| | අගෝස්තු | 176.2 | -0.3% | 6.3% | 8.0% |
| | සැප්තැම්බර් | 175.8 | -0.2% | 6.2% | 7.8% |
| | ඔක්තෝබර් | 176.1 | 0.2% | 6.7% | 7.6% |
| | නොවැම්බර් | 176.5 | 0.2% | 5.6% | 7.3% |
| | දෙසැම්බර් | 176.5 | 0.0% | 4.7% | 6.9% |
| 2014 | ජනවාරි | 177.5 | 0.6% | 4.4% | 6.5% |
| | පෙබරවාරි | 177.8 | 0.2% | 4.2% | 6.0% |
| | මාර්තු | 177.9 | 0.1% | 4.2% | 5.7% |
| | අප්‍රේල් | 178.4 | 0.3% | 4.9% | 5.6% |
| | මැයි | 179.5 | 0.6% | 3.2% | 5.3% |
| | ජූනි | 181.4 | 1.1% | 2.8% | 4.9% |
| | ජූලි | 183.2 | 1.0% | 3.6% | 4.7% |
| | අගෝස්තු | 182.3 | -0.5% | 3.5% | 4.5% |
| | සැප්තැම්බර් | 181.9 | -0.2% | 3.5% | 4.2% |
| | ඔක්තෝබර් | 179.0 | -1.6% | 1.6% | 3.8% |
| | නොවැම්බර් | 179.2 | 0.1% | 1.5% | 3.5% |
| | දෙසැම්බර් | 180.2 | 0.6% | 2.1% | 3.3% |

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | උද්ධමනය | |
|---|---|---|---|---|---|
| | | | | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % |
| 2015 | ජනවාරි | 183.2 | 1.7% | 3.2% | 3.2% |
| | පෙබරවාරි | 178.9 | -2.3% | 0.6% | 2.9% |
| | මාර්තු | 178.1 | -0.4% | 0.1% | 2.5% |
| | අප්‍රේල් | 178.5 | 0.2% | 0.1% | 2.1% |
| | මැයි | 179.8 | 0.7% | 0.2% | 1.9% |
| | ජූනි | 181.6 | 1.0% | 0.1% | 1.7% |
| | ජූලි | 182.8 | 0.7% | -0.2% | 1.3% |
| | අගෝස්තු | 181.9 | -0.5% | -0.2% | 1.0% |
| | සැප්තැම්බර් | 181.4 | -0.3% | -0.3% | 0.7% |
| | ඔක්තෝබර් | 182.1 | 0.4% | 1.7% | 0.7% |
| | නොවැම්බර් | 184.7 | 1.4% | 3.1% | 0.9% |
| | දෙසැම්බර් | 185.2 | 0.3% | 2.8% | 0.9% |
| 2016 | ජනවාරි | 184.9 | -0.2% | 0.9% | 0.7% |
| | පෙබරවාරි | 183.8 | -0.6% | 2.7% | 0.9% |
| | මාර්තු | 181.7 | -1.1% | 2.0% | 1.1% |
| | අප්‍රේල් | 184.1 | 1.3% | 3.1% | 1.3% |
| | මැයි | 188.5 | 2.4% | 4.8% | 1.7% |
| | ජූනි | 192.5 | 2.1% | 6.0% | 2.2% |
| | ජූලි | 192.9 | 0.2% | 5.5% | 2.7% |

මූලාශ්‍ර: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

# මූලික උද්ධමනය, එහි වැදගත්කම සහ ගණනය කිරීමේ විවිධ ක්‍රම

**ඊ. එච්. ලියනගේ,** ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
**එන්. එස්. කේ. මල්ලිකාරච්චි,** ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, මානව සම්පත් දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

1970 දශකයේ මැද භාගයේ දී රොබර්ට් ජේ ගෝර්ඩන් විසින් හඳුන්වා දුන් මූලික උද්ධමනය (Core Inflation) යන සංකල්පය, පසුකාලීන ව විශේෂයෙන් ම මුදල් ප්‍රතිපත්ති රාමුවට උද්ධමන ඉලක්කකරණය හඳුන්වා දීමත් සමඟ වඩාත් අවධානයට යොමු විය. එම නිසා මූලික උද්ධමනයේ වැදගත්කම, එය ගණනය කිරීමේ විවිධ ක්‍රම සහ මූලික උද්ධමනය පිළිබඳ විවිධ රටවල අත්දැකීම් විමසා බැලීම මෙම ලිපියේ අරමුණු වේ.

## මූලික උද්ධමනය

මූලික උද්ධමනය හඳුන්වා දීමට පෙර සමස්ත උද්ධමනය නැතහොත් මතුපිට උද්ධමනය (Headline Inflation) හඳුනා ගැනීම වැදගත් වේ. ආර්ථිකයක පවතින සියලු ම භාණ්ඩ හා සේවාවල මිල ගණන් නියෝජනය කරන පොදු මිල මට්ටමෙහි සිදුවන අඛණ්ඩ ඉහළ යෑම සමස්ත නැතහොත් මතුපිට උද්ධමනය ලෙස හැඳින්වේ. මෙම උද්ධමනයෙහි කාලයක් තිස්සේ දක්නට ලැබෙන යටිදැරි උපනතිය මූලික උද්ධමනය නැතහොත් යටිදැරි උද්ධමනය ලෙස හැඳින්වේ.

මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ දී හා ක්‍රියාවට නැංවීමේ දී මූල්‍ය අධිකාරීන්ට මෙම මූලික උද්ධමනය ඉතා වැදගත් මානයක් වේ. මතුපිට උද්ධමනය තාවකාලික සැපයුම් කම්පන හෝ සාපේක්ෂ මිල ගණන්වල ස්ථිර වෙනස්වීමක් හේතුවෙන් කෙටි කාලීන විචලනයන්ට බඳුන් විය හැකි ය. එහෙයින් මතුපිට උද්ධමනය මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා පාදක කර ගැනීම යෝග්‍ය නොවේ. නමුත් මූලික උද්ධමනය ගණනය කිරීමේ දී මතුපිට උද්ධමනයෙහි ඇතුළත් මෙම නිරන්තර කෙටි කාලීන විචලනයන්ට බඳුන් වන සංඝටක ඉවත් කරනු ලබන හෙයින් එය මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා වඩා සුදුසු මිනුමක් වේ. මුදල් ප්‍රතිපත්තිය හරහා දිගු කාලීන ව උද්ධමනය පාලනය කළ හැකි වුව ද එමගින් සාපේක්ෂ මිල ගණන්වල සිදුවන වෙනස්කම් පාලනය කළ නො හැකි ය. උදාහරණයක් ලෙස අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඇති වන සැපයුම් බාධා නිසා නැවුම් ආහාරවල මිල ගණන් කෙටිකාලීන ව අධික ලෙස ඉහළ යා හැකි ය. කෙසේ වුව ද, සැපයුම යථා තත්ත්වයට පත්වීමත් සමඟ එම මිල ගණන් නැවත පහළ යයි. මෙය මුදල් ප්‍රතිපත්තිය මගින් පාලනය කළ නො හැකි අතර ම මූලික උද්ධමනය සඳහා ද බලපෑමක් ඇති නො කරයි. එහෙයින් මෙහි දී මූලික උද්ධමනය වෙනුවට මතුපිට උද්ධමනය මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා යොදා ගත්තේ නම් ඒ මගින් උද්ධමනයෙහි සහ නිපැයුම් වර්ධනයෙහි වඩාත් දැඩි විචලතාවන් ඇති කිරීමේ අවදානමක් පවතී. මෙලෙස ම සාපේක්ෂ මිල ගණන්වල ස්ථිර වෙනස්වීමක් නිසා ද මතුපිට උද්ධමනයෙහි තාවකාලික වෙනස්වීමක් දැකිය හැකි ය. උදාහරණයක් ලෙස, ජාත්‍යන්තර වෙළෙඳපොළ මිල ගණන් ඉහළ යෑම නිසා දේශීය ඉන්ධන මිල ගණන් ඉහළ ගිය අවස්ථාවක එම මිල ගණන් කෙටි කාලීන ව නැවතත් මුල් මට්ටමට පත් වීමට ඇති ඉඩකඩ ඉතා අඩු ය. කෙසේ වුව ද, එම මිල ඉහළ යෑම එක් වර සිදු වූවක් හෙයින් වෙනස් වීමේ ශීඝ්‍රතාව දිගින් දිගට නො පවතී. එහෙයින් මතුපිට උද්ධමනය ක්‍රමයෙන් එහි යටිදැරි අනුපාතය කරා නැවත අඩු වේ. මෙ ලෙස මතුපිට උද්ධමනය ඉහළ නැගුණු අවස්ථාවක ඊට පිළියම් ලෙස මුදල් ප්‍රතිපත්තිය දැඩි කළහොත් ඒ මගින් ආර්ථික වර්ධනය කෙරෙහි අයහපත් බලපෑමක් ඇති කළ හැකි ය. කෙසේ වුව ද, ඉන්ධන ආදියෙහි සාපේක්ෂ මිල ගණන් නැවත නැවත

අඛණ්ඩ ව ඉහළ යෑම යටිදැරි උද්ධමනය ඉහළ නැංවීම සඳහා හේතු විය හැකි ය. තව ද, මෙවැනි ඉන්ධන මිල ඉහළ යෑම්වල ඍජු බලපෑම යටිදැරි උද්ධමනය කෙරෙහි වැදගත් නොවුව ද එහි ද්විතීයික (වක්‍ර) බලපෑම යටිදැරි උද්ධමනය සඳහා වැදගත් වේ. සාපේක්ෂ මිල ගණන්වල ඉහළ යෑම හේතුවෙන් මහජනතාව තුළ ඇති වන දිගුකාලීන උද්ධමන අපේක්ෂාවන් මත මෙම ද්විතීයික බලපෑමෙහි ප්‍රමාණාත්මක බව තීරණය වේ.

තව ද, මූලික උද්ධමනය, උද්ධමනයේ වර්තමාන හා අනාගත උපනති හඳුනා ගැනීම සඳහා වඩාත් යෝග්‍ය දර්ශකයක් ලෙස සැලකිය හැකි ය. එසේ ම, මූලික උද්ධමනය ප්‍රත්‍යක්ෂ මූලික කටයුතු (Empirical WWork) සඳහා ද වැදගත් වේ. විශේෂයෙන් මහ බැංකුකරුවන් ඇතුළු ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් මුදල් ප්‍රතිපත්තිය, ආර්ථික කටයුතු සහ උද්ධමනය අතර පවතින අන්තර් ක්‍රියාකාරීත්වය පිළිබඳ ව මනා අවබෝධයක් ලබා තිබීම අවශ්‍ය වේ. එහි දී තවදුරටත් ප්‍රතිපත්ති විමර්ශනය කිරීමේ දී උද්ධමනය සඳහා නිවැරදි මිනුමක් අවශ්‍ය වන අතර, මේ සඳහා මූලික උද්ධමනය භාවිත කිරීම වඩාත් යෝග්‍ය බව හඳුනා ගෙන ඇත. ඉහත කරුණු අනුව මුදල් ප්‍රතිපත්ති හැසිරවීමෙහිලා මූලික උද්ධමනය යොදා ගැනීමෙහි වැදගත්කම පැහැදිලි වන අතර, ඊට අමතරව මතුපිට උද්ධමනයෙහි හැසිරීම පිළිබඳව ද සැලකිලිමත් වන බව සඳහන් කළ යුතු ය.

**මූලික උද්ධමනය ගණනය කිරීම**

මූලික උද්ධමනය ගණනය කිරීමේ ක්‍රමවේදයන් කිහිපයක් පවතී. 1990 දශකය වන තෙක් ම මූලික උද්ධමනය ගණනය කරන ලද්දේ පාරිභෝගික මිල දර්ශකයෙන් ආහාර හා බලශක්ති වැනි වඩාත් මිල විචලනයන්ට භාජනය වන අයිතම ඉවත් කිරීමෙනි. මූලික උද්ධමනය මැනීමේ දී විවිධ සංකල්ප සලකා බලනු ලබයි. මෙහි දී භාවිතා කරන ක්‍රමවේදයන් ප්‍රධාන වශයෙන් කොටස් හතරකට බෙදා දැක්විය හැකි ය.

1. **සුමටනය (Smoothing)**
   මූලික උද්ධමන මිනුම් සුමටනය හරහා ලබා ගත හැකි අතර එය සරල වෙනස්වීමේ සාමාන්‍යයේ සිට උපනති රේඛාවන් දක්වා විහිදී යයි. මේ යටතේ ක්‍රම කිහිපයක් යොදා ගනිමින් මූලික උද්ධමන මිනුම් ගණනය කරයි. විශේෂයෙන්ම වසර කිහිපයක් පුරා මතුපිට උද්ධමනයෙහි සාමාන්‍ය ගණනය කිරීම හරහා එහි විචලනය සුමටනය කිරීමෙන් ලබාගන්නා වාර්ෂික සාමාන්‍යය ද මතුපිට උද්ධමනය ඍතුමය වෙනස්කම් අනුව ගැලපීමෙන් මිල ගණන්වල විචලනය ඉවත් කිරීමෙන් ලබාගන්නා දර්ශකය ද මූලික උද්ධමන මිනුම් ලෙස භාවිත කළ හැකිය.

2. **බැහැර කිරීමේ ක්‍රමය (Exclusion Method)**
   මූලික උද්ධමනය ගණනය කිරීමේ වඩාත් ප්‍රචලිත ක්‍රමය වන බැහැර කිරීමේ ක්‍රමයේ දී සෑම කාලපරිච්ඡේදයක දී ම ඒකාකාරී අයුරින් පාරිභෝගික මිල දර්ශකයෙන් යම් නිශ්චිත අයිතම සංඛ්‍යාවක් ඉවත් කර මූලික උද්ධමන දර්ශකය ගණනය කරනු ලබයි. සාමාන්‍යයෙන් මෙසේ ඉවත් කරනු ලබන්නේ ආහාර හා බලශක්තිය වැනි වඩාත් මිල උච්චාවචනයන්ට ලක් වන අයිතම සහ පාලන මිල ගණන්වලට යටත් වන අයිතම වේ.

3. **සංඛ්‍යානමය ප්‍රවේශය (Statistical Approach)**
   සංඛ්‍යානමය ප්‍රවේශය භාවිත කරමින් ද ප්‍රධාන දර්ශකයෙන් මිල ගණන් විචලනය වන අයිතම ඉවත් කළ හැකි ය. මෙම ක්‍රමවේදය මගින් විශාල මිල විචලනයන් ඉවත් කරනු ලබන අතර ඒ සඳහා විවිධ සංඛ්‍යානමය ක්‍රමවේද භාවිත කරයි.

   (i) කප්පාදු මධ්‍යයනය (**Trimmed Mean**)
   මෙම ක්‍රමයේ දී ඉතා ඉහළ හා ඉතා පහළ මිල විචලනයන් සහිත අයිතම, දර්ශකයෙන් ඉවත් කරනු ලැබේ. මෙම ක්‍රමවේදය ද පදනම් වන්නේ යම් අයිතම කිහිපයක් ඉවත් කිරීමෙන් පසු ව දර්ශකය නැවත සකස් කිරීම මතයි. කෙසේ වුවත් එක් එක් කාලපරිච්ඡේදයේ දී ඉවත් කරන අයිතම ඒකාකාරී නො වන නිසා මෙම ක්‍රමවේදය චර්යාත්මක ක්‍රමවේදයෙන් වෙනස් වේ.

   (ii) බරිත මධ්‍යස්ථය (**Weighted Median**)
   මෙහි දී සිදු කරනුයේ මිල වෙනස්වීම්වල මධ්‍යස්ථ අගයන් ඉවත් කිරීමෙන් මූලික උද්ධමනය ගණනය කිරීමයි.

4. ආර්ථිකමිතික ක්‍රම (**Econometric Methods**)
   ආර්ථිකමිතික ක්‍රම මගින් මූලික උද්ධමනය න්‍යායාත්මක ව නිර්වචනය කරන අතර එය ගණනය කිරීමට ආකෘතිකරණයක් යොදා ගනී.

මෙම ක්‍රමවේදය තුළින් ප්‍රතිපත්ති හා මූලික උද්ධමනය අතර ඍජු සබැඳියාවක් පිළිබිඹු කරයි. නව නිරීක්ෂණ එකතු වීමේ දී අතීත නිරීක්ෂණ වෙනස්වීම මෙම ක්‍රමවේදයේ පවතින මූලික දුර්වලතාවයකි. එ බැවින් සාමාන්‍ය ජනතාව වෙත නිවේදනය කරනු ලබන නිල මූලික උද්ධමනය ගණනය කිරීමේ දී මෙම ක්‍රමය යොදා ගැනීම සුදුසු නො වේ.

විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරමින් සකස් කරනු ලබන මූලික උද්ධමනය සතු විය යුතු ලක්ෂණ කිහිපයකි.

(i) අපක්ෂපාතී වීම: නිවැරදි මූලික උද්ධමන මිනුම් ක්‍රමයක දී මධ්‍යයන උද්ධමනය සැලකීමේ දී පාරිභෝගික මිල දර්ශකයට සාපේක්ෂ ව අපක්ෂපාතී විය යුතුය.

(ii) විචලනය වීම: මූලික උද්ධමනය මගින් උද්ධමනයේ යටිදැරි ප්‍රවණතා මතු කරන බැවින් නිවැරදි මිනුම් ක්‍රමයක දී පාරිභෝගික මිල දර්ශකයට වඩා මූලික උද්ධමනයේ විචලනය අඩු විය යුතු ය.

(iii) පුරෝකථන හැකියාව: මූලික උද්ධමනය යටිදැරි උද්ධමන පීඩනයන් මතු කර දක්වන බැවින් එය අනාගත උද්ධමන ප්‍රවණතාවන්හි පුරෝකථනයක් විය යුතු ය.

(iv) තත්ත්වාකාර ස්ථායීතාව: ප්‍රතිපත්තිමය වශයෙන් සැලකූ විට මූලික උද්ධමන මිනුම් නිශ්චිත කාලයක් තුළ දී සිදු කර දත්ත නිකුත් කළ යුතු අතර සංශෝධන සිදු නො කළ යුතු ය.

## ජාත්‍යන්තර භාවිතයන්

මූලික උද්ධමන මිනුම් පළමුවෙන්ම 1970 දශකයේ දී කතාබහට ලක් වූ අතර විවිධ රටවල් විවිධ කාලවකවානුවල දී මූලික උද්ධමනය සැකසීම ආරම්භ කර ඇත. මූලික උද්ධමනය මැනීමේ වඩාත් ප්‍රචලිත ක්‍රමය වන්නේ බැහැර කිරීමේ ක්‍රමවේදයයි. සංවර්ධනය වෙමින් පවතින රටවල පාරිභෝගික මිල දර්ශකයේ ආහාර අයිතම සඳහා වැඩි බර තැබීමක් කරන බැවින් එම රටවලින් බොහොමයක් මූලික උද්ධමනය ගණනය කිරීමේ දී සියලු ම ආහාර අයිතම ඉවත් කිරීම වෙනුවට තෝරා ගන්නා ලද ආහාර අයිතම පමණක් ඉවත් කරයි.

සංඛ්‍යා සටහන 1 මගින් තෝරාගත් රටවල් කිහිපයක උද්ධමන මිනුම් දැක්වේ.

**සංඛ්‍යා සටහන 1**

**තෝරා ගත් රටවල් කිහිපයක මූලික උද්ධමන මිනුම්**

| රට | මූලික උද්ධමන මිනුම |
|---|---|
| ඉන්දියාව | තොග මිල දර්ශකයෙන් ආහාර සහ ඉන්ධන අයිතමයන් ඉවත් කර ඇත. |
| මැලේසියාව | පාරිභෝගික මිල දර්ශකයෙන් ආහාර සහ ඉන්ධන අයිතමයන් ඉවත් කර ඇත. |
| පිලිපීනය | පාරිභෝගික මිල දර්ශකයෙන් තෝරාගත් ආහාර සහ බලශක්ති අයිතමයන් ඉවත් කර ඇත.<br>කප්පාදු මධ්‍යන්‍යය<br>බරිත මධ්‍යස්ථය |
| තායිලන්තය | පාරිභෝගික මිල දර්ශකයෙන් නැවුම් ආහාර හා ඉන්ධන ඉවත් කර ඇත.<br>කප්පාදු මධ්‍යයනය |
| ඉන්දුනීසියාව | පාරිභෝගික මිල දර්ශකයෙන් පාලන මිල ගණන් සහ වැඩි විචලනයක් සහිත ආහාර අයිතමයන් ඉවත් කර ඇත. |
| බංගලාදේශය | පාරිභෝගික මිල දර්ශකයෙන් ආහාර සහ ඉන්ධන මිල ගණන් ඉවත් කර ඇත. |
| දකුණු කොරියාව | පාරිභෝගික මිල දර්ශකයෙන් කෘෂිකාර්මික නිෂ්පාදිත හා ඛනිජ තෙල් නිෂ්පාදිත ඉවත් කර ඇත.<br>කප්පාදු මධ්‍යයනය |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව (2007), පෙරේරා ආර්.ඒ.ඒ. (2009) සහ අදාළ රටවල මහ බැංකු

ශ්‍රී ලංකාවේ මෙන් ම ලෝකයේ වෙනත් බොහෝ රටවල් මූලික උද්ධමනය ගණනය කිරීම සඳහා බැහැර කිරීමේ ක්‍රමවේදය අනුගමනය කළ ද විශේෂයෙන් ම, උද්ධමන පුරෝකථන වඩාත් නිවැරදි ව සහ පහසුවෙන් කර ගැනීමට හැකිවීම නිසා සංඛ්‍යානමය ප්‍රවේශයන් මේ සඳහා යොදා ගැනීම වඩාත් උචිත වේ. නමුත් ඒ සඳහා ප්‍රමාණවත් විශ්වාසදායක දත්ත සමුදායක් අදාළ විචල්‍යයන් සඳහා නො පැවතීම බාධාවක් ව පවතී.

## ශ්‍රී ලංකාවේ මූලික උද්ධමනය


ශ්‍රී ලංකාව සඳහා මුලින්ම මූලික උද්ධමන දර්ශකයක් සකසනු ලබන්නේ 2008 වසරේ අප්‍රේල් මාසයේ දී කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පදනම් වර්ෂය 2002 ලෙස යාවත්කාලීන කිරීමට සමගාමී ව ය. ඒ අනුව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ භාණ්ඩ පැසෙන් සියලු ම ආහාර සහ බලශක්ති අයිතමයන් ඉවත් කොට සාදා ගත් භාණ්ඩ පැසක් ආශ්‍රයෙන් මූලික උද්ධමනය මිනුම් කෙරුණි. මෙ ලෙස ඉවත් කළ සියලු භාණ්ඩවල බර තැබුම කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ සමස්ත භාණ්ඩ පැසෙන් සියයට 54.6 කි. අනතුරුව කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි පදනම් වර්ෂය 2006/07 ලෙස යාවත්කාලීන කිරීමේ දී ඊට අනුරූපව මූලික උද්ධමන දර්ශකය සැකසීම සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශක භාණ්ඩ පැසෙන් සහල්, පොල්, නැවුම් ආහාර ද්‍රව්‍ය, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කරන ලදී. මෙ ලෙස ඉවත් කරන ලද අයිතමයන්ගේ බර තැබුම සියයට 34.7 කි. මේ අතර, 2015 වසරේ නොවැම්බර් මස සිට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) (ජා.පා.මි.ද.) මගින් 2012/2013 හි පවත්වන ලද කුටුම්බ ආදායම් හා වියදම් සමීක්ෂණයෙන් හෙළි වූ පරිදි සමස්ත දිවයිනෙහි කුටුම්බවල මාසික පරිභෝජන වියදම් නිරූපණය වන අතර, දර්ශක ගණනය සඳහා දිවයින පුරා සියලු ම දිස්ත්‍රික්කවල නගරවලින් මිල ගණන් එක් රැස් කෙරේ. මීට අදාළ ව බැහැර කිරීමේ ක්‍රමවේදය යොදා ගනිමින් ගණනය කළ මූලික උද්ධමන දර්ශකය 2016 වසරේ ජුනි මාසයේ දී හඳුන්වා දුන් අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ භාණ්ඩ පැසෙන් නැවුම් ආහාර, බලශක්ති සහ ප්‍රවාහන අයිතම ඉවත් කොට එම මූලික දර්ශකය ගණනය කරනු ලැබේ. මෙහි දී ඉවත් කරන ලද අයිතමයන්ගේ බර තැබීම සියයට 31.4 කි. මේ අනුව, කාලයත් සමඟ සමස්ත දර්ශකයෙන් මූලික දර්ශකය ගණනය කිරීමේ දී ඉවත් කරනු ලබන අයිතමවල බර තැබීම අඩු වී ඇත.

මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ මූලික උද්ධමනය සැලකීමේ දී 2015 වසර පුරා ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, 2016 වසරේ මිශ්‍ර විචලනයක් දක්නට ලැබුණි. 2015 වසරේ පෙබරවාරි මාසයේ දී අත්‍යවශ්‍ය භාණ්ඩ රැසක් සඳහා උපරිම සිල්ලර මිල ගණන් පැනවීම හේතුවෙන් භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම වළක්වා ගැනීම නිසා කොළඹ පාරිභෝගික මිල දර්ශක මගින් ගණනය කරනු ලබන මූලික උද්ධමනය අඩු විය. ඉන්පසු ක්‍රමයෙන් මූලික උද්ධමනය ද ඉහළ

රූප සටහන 1

**ශ්‍රී ලංකාවේ මතුපිට සහ මූලික උද්ධමනය**

**(වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)**



ගිය අතර 2016 මැයි මාසයේ දී මෑත කාලයේ වාර්තා වූ ඉහළ අගය වෙත ළඟා විය. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ භාණ්ඩ බොහොමයක් සඳහා එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 11 සිට සියයට 15 දක්වා ඉහළ නැංවීමයි. එම ක්‍රියාමාර්ගය තාවකාලික ව ඉවත් කිරීම හේතුවෙන් ක්‍රමයෙන් උද්ධමනය අඩු වූ අතර නැවතත් බදු අනුපාතය 2016 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කිරීම හේතුවෙන් මූලික උද්ධමනය ඉහළ ගියේ ය. ඒ අනුව, රජයේ බදු වෙනස් කිරීම ප්‍රධාන වශයෙන් ම හේතු කොට ගනිමින් 2016 දෙසැම්බර් මස අවසානය වන විට කොළඹ පාරිභෝගික මිල දර්ශක මත ගණනය කරන ලද මූලික උද්ධමනය සියයට 6.3 දක්වා ඉහළ ගියේ ය. මෙවැනි තාවකාලික විචලනයන් සිදු වුව ද ඉදිරි කාලයේ දී උද්ධමනය හා මූලික උද්ධමනය තවදුරටත් මැද තනි අගයක මට්ටමේ පවතිනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

**සාරාංශය**

1975 දශකයේ මැද භාගයේ දී ලොවට හඳුන්වා දුන් මූලික උද්ධමනය පසුකාලීන ව වඩාත් අවධානයට ලක් වූ සංකල්පයකි. මතුපිට උද්ධමනය ගණනය කිරීමේ දී කෙටිකාලීන ව විචලයන්ට ලක්වන අයිතම යොදා ගන්නා බැවින් එය මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා පාදක කර ගැනීම ගැටලු සහගත වේ. එ බැවින් මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ දී හා ක්‍රියාවට නැංවීමේ දී මූලික උද්ධමනය ඉතා වැදගත් වේ. මූලික උද්ධමනය ගණනය කිරීමේ දී විවිධ ක්‍රමවේද භාවිත කරනු ලබන අතර වඩාත් ප්‍රචලිත ක්‍රමය වනුයේ බැහැර කිරීමේ ක්‍රමයයි. 2008 වසරේ දී ශ්‍රී ලංකාව කොළඹ පාරිභෝගික මිල දර්ශක පදනම් කර ගෙන මූලික උද්ධමන දර්ශකය ගණනය කිරීම ආරම්භ කළ අතර 2016 වසරේ ජුනි මාසයේ සිට ජා.පා.මි.ද. පදනම් කරගෙන ද මූලික උද්ධමනය ගණනය කරනු ලැබේ.


**මූලාශ්‍ර**


Perera R.A.A. (2009) "Core Inflation in Sri Lanka( Is It a Useful Guiding Indicator in Conducting Monetary Policy?", International Research Conference central Bank of Sri Lanka

Rummel, O.(2015), " The common component of CPI( an alternative measure of underlying inflation", 2nd SEACEN Intermediate Course on Econometric Modeling and Forecasting" Philippines

වාර්ෂික වාර්තාව - ශ්‍රී ලංකා මහ බැංකුව (2007)






## දැනුම අලුත් කර ගන්න

**මුදලේ** ඉතිහාසය

- ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලේ ඉතිහාසය
- විවිධ යුගවල දී භාවිත වූ කාසි හා නෝට්ටු
- ව්‍යවහාර මුදල් මණ්ඩල යුගයේ දී භාවිත කළ නෝට්ටු
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියලු ම නෝට්ටු කාණ්ඩ
- ශ්‍රී ලංකා සමරු කාසි විකිණීම
- ශ්‍රී ලංකා සමරු කාසි
- මුදල් නෝට්ටු නිෂ්පාදනය
- මුදල් නෝට්ටු වල ආරක්ෂක සලකුණු

**මහ බැංකු** ප්‍රකාශන

- උසස් පෙළ, විශ්වවිද්‍යාල සිසුන්ට, විද්‍යාර්ථීන්ට සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ට
- නවතම දත්ත සහ සංඛ්‍යාන තොරතුරු
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින්

**පාසල් ළමුන් සඳහා**

- ඉල්ලීම් මත පාසල් ළමුන් සඳහා විශේෂ දේශන
- ආර්ථික හා මූල්‍ය විෂයයන් අලළා ලියවුණු වටිනා පොත් සහ වාර සඟරා රැසක් විකිණීමට

පාසල් කණ්ඩායම් වශයෙන් පැමිණීම සඳහා විමසන්න.

**011-2477257**

ෆැක්ස් 011-2346304, ඊ-මේල්; dcommunications@cbsl.lk

**ව්‍යවහාර මුදල් අංශය**

දුරකථන : 011-2444503, 011-2477578
ඊ-මේල්: currency@cbsl.lk

**ප්‍රකාශන අංශය**

දුරකථන: 011-2444502, 011-2477418
ඊ-මේල්: dcommunications@cbsl.lk

සඳුදා සිට සිකුරාදා තෙක්
පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා
(බැංකු නිවාඩු දිනයන්හිදී වසා තැබේ)

සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල,
නො. 54, චැතම් වීදිය, කොළඹ 01

# ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය සහ ආදායම් දරිද්‍රතා දර්ශකය සංසන්දනය

ඩබ්.එච්.අයි. මධුවන්ති
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
අභ්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව

දිළිඳුබව ඔබ නොකළ අපරාධයකට ඔබට ලැබෙන දඬුවමක් වැනි ය...

- එලී කම්රෝ

**කුමක්ද මේ දරිද්‍රතාව ....?**

ලෝක බැංකු සංගමය නිර්වචනය කරන පරිදි දරිද්‍රතාව යනු බඩගින්නයි; නිවසක් නොමැතිකමයි; රෝගී වූවද වෛද්‍යවරයෙකු වෙත යෑමේ හැකියාවක් නොමැතිකමයි; පාසලකට ඇතුළත් වීමට හැකියාවක් නොමැතිකම හා සාක්ෂරතාව නොමැතිකමයි; රැකියාවක් නොමැති වීම නිසා අනාගතය පිළිබඳ ව පවත්නා බිය හා එදිනෙදා ජීවත් වීමට මුදල් සොයා ගැනීම පිළිබඳ පවත්නා අවිනිශ්චිතභාවයයි.

මේ නිර්වචනය අනුව දරිද්‍රතාවන් යන්න ලුහුඬු දැක්වූ විට පුද්ගලයින්ගේ එදිනෙදා ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍ය මූල්‍ය හා අනෙකුත් අවශ්‍යතා ලබාගැනීමේ දුර්වලතාවයි. දරිද්‍රතාව මුහුණුවර කීපයකින් දැකිය හැකි ය. විටෙක එය බඩගින්න පිළිබඳ ගැටලුවකි, විටෙක එය නිවාසයක් නොමැති බව පිළිබඳ ගැටලුවකි, විටෙක එය අයහපත් අධ්‍යාපන හෝ සෞඛ්‍ය තත්ත්වයක් පිළිබඳ ගැටලුවකි. මේ ආකාරයේ වූ දරිද්‍රතාව සමාජයක් රටක් ආර්ථිකයක් පීඩනයට පත් කරන ගැටලුවකි.


**ශ්‍රී ලංකාවේ ආදායම් දරිද්‍රතාව ව්‍යාප්තිය හා හැසිරීම**

ආදායම් දරිද්‍රතාව යනු ජීවත්වීමට ප්‍රමාණවත් තරම් ආදායමක් නො ලබන තත්ත්වයයි. මෙය ගණනය කරන්නේ ජාත්‍යන්තර දරිද්‍රතා ඉම පදනම් කර ගෙන ය. එනම් දිනකට ඇමරිකානු ඩොලර් 1.25 ට වඩා අඩු ආදායම් ලබන පිරිස දිළින්දන් වශයෙන් සලකනු ලැබේ.

2015 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව දරිද්‍රතා ඉමට පහළින් සිටින ජනගහනය දළ වශයෙන් 6.7%කි. එනම් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 6.7% දිළිඳු පුද්ගලයන් වශයෙන් අර්ථ දක්වා ඇත. මුළු ජනගහනයෙන් 22.7% ක් දිළිඳු පුද්ගලයන් වශයෙන් හඳුනාගෙන ඇති 2000 වසර සමඟ සැසඳීමේ දී ලංකාවේ දරිද්‍රතාව කැපී පෙනෙන ලෙස අඩු වී ඇති බව නිරීක්ෂණය කළ හැකි ය. ඒ අනුව ශ්‍රී ලංකාව 2015 වසරේ දී දරිද්‍රතාව අඩකින් අඩු කිරීමේ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථය අත්පත් කර ගෙන ඇත.

එසේ වුවත්, ශ්‍රී ලංකාවේ ආදායම් දරිද්‍රතා අගයයන් නිරීක්ෂණය කිරීමේ දී භූගෝලීය පිහිටීම අනුව දරිද්‍රතා අගයයන් වෙනස් වන බව දැකිය හැකි ය. 2012/13 සමාජ ආර්ථික දත්ත අනුව මුලතිව් දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ ඉහළම දරිද්‍රතා අගයක් වාර්තා කරන අතර මුලතිව් දිස්ත්‍රික්කයේ 28.8%ක ජනගහනයක් දරිද්‍රතාවෙන් පෙළෙන බව පෙන්නුම් කරයි. එසේ ම මොණරාගල, මන්නාරම හා අම්පාර දිස්ත්‍රික්ක 19%ට ඉහළ දරිද්‍රතා මට්ටමක් වාර්තා කරයි. එයට සාපේක්ෂ ව කොළඹ, ගම්පහ හා කළුතර දිස්ත්‍රික්කවල දරිද්‍රතා මට්ටම 3.4% ට අඩු අගයක් වාර්තා කරයි. මේ අනුව ආදායම් දරිද්‍රතාව ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය වශයෙන් විෂම ව්‍යාප්තියක් පෙන්නුම් කරයි.

## ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ ප්‍රාදේශීය ව්‍යාප්තිය 2012/2013





මූලය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

එසේ ම ආංශික අගයයන් සැලකීමේ දී නාගරික, ග්‍රාමීය හා වතු අතර ද ආදායම් ව්‍යාප්ති විෂමතාව ඉහළ අගයක් ගන්නා බව දැකිය හැකි ය. 2012/13 සමීක්ෂණ දත්ත අනුව මෙම අංශ අතර ග්‍රාමීය අංශය අනෙකුත් අංශයන්ට සාපේක්ෂ ව ඉහළ දරිද්‍රතා අගයක් වාර්තා කරයි.

## දිළිඳු ජනගහනය 2012/13

| අංශය | දිළිඳු ජනගහනය (දහස්) | ප්‍රතිශතය (මුළු ජනගහනයෙන්) |
|---|---|---|
| නාගරික | 75 | 5.6 |
| ග්‍රාමීය | 1163 | 86.9 |
| වතු | 101 | 7.5 |
| සමස්ත | 1339 | 100.0 |





නාගරික ග්‍රාමීය වතු

සමස්තයක් වශයෙන් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අඩු වීමක් පෙන්නුම් කළ භූගෝලීය වෙනස්කම් අනුව එම තත්ත්වයන් වෙනස්වීමක් හෝ සාධාරණ ආදායම් බෙදීයාමක් සිදු වී නොමැති බව මේ අනුව පෙනී යන කරුණකි. එසේ වුවත්, දරිද්‍රතාව මෙම සංඛ්‍යා දත්ත මගින් සැබෑවට ම නිරූපණය වේද යන්න පිළිබඳව දිගු කලක සිට විවිධ මතභේද පවතී. මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් ලැබේ ද යන්න පමණක් මිණුම් කරන ජාත්‍යන්තර දරිද්‍රතා ඉම කෙතරම් පුළුල් ව දරිද්‍රතාව ගණනය කරන්නේ ද? එ තුළින් දිළින්දන් යැ යි හඳුනාගන්නා පිරිස සත්‍ය වශයෙන් ම දිළින්දන් ම ද? ආදායම හා වියදම තුළින් පමණක් ජීවිතයේ ගුණාත්මක බව මැනිය හැකි ද? යන්න විවේචනාත්මක කරුණක් බවට පත් ව ඇත. මෙම දුර්වලතා මග හරවමින් දරිද්‍රතාවය මැනීමේ නව දර්ශකයක් 2010 වසරේ දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් හඳුන්වා දෙන ලදි. මෙම දර්ශකය මගින් සමාජයේ දී පුද්ගලයන් මුහුණපාන විවිධ විහීනතා (Potentials) පදනම් කරගෙන දරිද්‍රතාව ගණනය කරයි. මෙම දර්ශකය සංයුක්ත දර්ශකයක් වශයෙන් පවතින අතර මේ තුළින් දරිද්‍රතාව, ආදායමට වඩා වැඩි අංග ගණනක් ඔස්සේ ගණනය කරනු ලබයි.

## බහුමාන දරිද්‍රතා දර්ශකය

2010 මානව සංවර්ධන වාර්තාව මගින් හඳුන්වා දෙන ලද බහුමාන දරිද්‍රතා දර්ශකය මගින් ආදායම පදනම් කරගත් සරල මිනුමක් ඔස්සේ අන්ත දුගී භාවය මිනුම් කරනවා වෙනුවට පුද්ගල මට්ටමේ දී මිනිසුන්ට මුහුණ පෑමට සිදුවන විවිධ විහීනතාවයන් (Potentials) පදනම් කරගෙන දරිද්‍රතාව මිනුම් කරනු ලැබේ. බහුමාන දරිද්‍රතා දර්ශකය පෙර පැවති මානව සංවර්ධන දර්ශකය වෙනුවට හඳුන්වා දෙන ලද මිනුමකි.

මානව සංවර්ධන දර්ශකය ප්‍රධාන මිනුම් තුනක් ඔස්සේ ගණනය කරයි.



මානව සංවර්ධන දර්ශකය තුළින් රටවල දරිද්‍රතා මට්ටම ගණනය කළ හැකි වුවත් එහි විහිදීම් පිළිබඳ ව නිශ්චිත මිනුමක් ලබා නොදේ. මානව සංවර්ධන දර්ශකය 0-1 අතර අගයක පවත්නා අතර එහි පහතාකාර දුර්වලතා පවතී.

- මේ තුළින් දිගු කාලීන වෙනස්කම් ග්‍රහණය කරගන්නා නමුත් කෙටිකාලීන වෙනස්කම් සැලකිල්ලට නො ගනී. (උදා - ආයු අපේක්ෂාව සැලකිල්ලට ගත්ත ද මන්දපෝෂණය සැලකිල්ලට නො ගනී)
- ඒක පුද්ගල ආදායම තුළින් ආදායම් විශමතාව පිළිබිඹු නොවේ.
- පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය කෙරෙහි මෙම දර්ශකයෙන් මනිනු නොලබන කරුණු රාශියක් පැවතීම. (උදා- යුධ බිය, පරිසර දූෂණය, පිරිසිදු පානීය ජලය පැවතීම)

මේ ආදී හේතු මත මානව සංවර්ධන දර්ශකය දරිද්‍රතාව මනින පරිපූර්ණ මිනුමක් වශයෙන් පැවති දුර්වලතා මඟහැරවීමට බහුමාන දරිද්‍රතා දර්ශකය හඳුන්වා දෙන ලදී. බහුමාන දරිද්‍රතා දර්ශකය සෞඛ්‍ය, අධ්‍යාපනය හා ජීවන තත්ත්වය යන පුළුල් ක්ෂේත්‍ර තුනට ඇතුළත් විවිධ විහීනතා 10ක් මත පදනම් ව ගණනය කරනු ලැබේ.

| විහීනතාවන් | බර තැබීම |
|---|---|
| සෞඛ්‍යය | |
| ■ ළමා මර්ත්‍යතාව (පවුලේ ළමයෙකු මිය ගොස් තිබේ ද යන්න) | 1/6 |
| ■ පෝෂණය (පවුලේ වැඩිහිටියෙකු හෝ ළමයෙකු හෝ මන්දපෝෂණයෙන් පෙළෙනවා ද යන්න) | 1/6 |
| අධ්‍යාපනය | |
| ■ පාසැල් අධ්‍යාපනය (වසර පහක්වත් පාසැල් අධ්‍යාපනය නො ලැබූ පවුලේ සාමාජිකයෙකු සිටී ද යන්න) | 1/6 |
| ■ පාසල් යෑම (පාසල් යන වයසේ සිටි කිසියම් ළමයෙකු වසර 1 සිට 8 දක්වා කාලයක් පාසල් අධ්‍යාපනය නො ලබා පාසල් හැර යෑමට සිදුවී ද?) | 1/6 |
| ජීවන තත්ත්වය | |
| ■ විදුලි බල සැපයුම (නිවසට විදුලිය තිබේ ද යන වග) | 1/6 |
| ■ ආරක්ෂිත පානීය ජලය ලබා ගත නො හැකි බව හෝ පානීය ජලය සපයා ගැනීමට විනාඩි 30කට වැඩි කාලයක් ඇවිදීමට සිදුවේ ද යන්න | 1/6 |
| ■ සනීපාරක්ෂාව (වැසිකිළි පහසුකම් තිබේ ද යන්න) | 1/6 |
| ■ නිවසේ බිම සකසා ඇති ආකාරය (සිමෙන්ති නො දැමූ වැලි හෝ මැටි බිම අතුරා තිබීම) | 1/6 |
| ■ කෑම පිසීමට යොදා ගන්නා ඉන්ධන (දර, ගල් අඟුරු, වියළි ගොම යොදා ගන්නවා ද යන වග) | 1/6 |
| ■ වත්කම් (ගුවන් විදුලිය, රූපවාහිනිය, යතුරු පැදිය, දුරකථනය යන භාණ්ඩ අතරින් එක් භාණ්ඩයකට වඩා හිමි කරගෙන නොමැති බව) | 1/6 |

**දරිද්‍රතා දර්ශක සංසන්දනය**


ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකයේ උපනතීන් හා ජනගහන දරිද්‍රතා දර්ශක අගයයන් පහත දැක්වේ.

**වගුව 01: ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය හා ජනගහන දරිද්‍රතා දර්ශක අගයයන්**

| වසර | බහුමාන දරිද්‍රතා දර්ශකයේ අගය | වසර | ජනගහන දරිද්‍රතා දර්ශකයේ අගය |
|---|---|---|---|
| 2003 | 5.3% | 2002 | 22.7% |
| 2006/07 | 7.0% | 2006/07 | 15.2% |
| 2009/10 | 4.7% | 2009/10 | 8.9% |

මේ අනුව ජනගහන දරිද්‍රතා රේඛාවෙන් මනිනු ලබන ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් සත්‍ය වශයෙන් ම දරිද්‍රතාවයෙන් පෙළෙන බව දත්ත අනුව පැහැදිලි වේ. බහුමාන දරිද්‍රතා අගයයන් සමස්තයක් වශයෙන් විහිද ඇති ආකාරය පිළිබඳව සලකා බැලීමේ දී, ආදායම් දරිද්‍රතා මට්ටම මගින් පෙන්නුම් කළ ප්‍රමාණයට වඩා අඩු දරිද්‍රතාවක් සියලු දිස්ත්‍රික්කවල පවතින බව පැහැදිලි වේ.

## බහුමාන දරිද්‍රතා දර්ශකය 2009/10





මූලය - ශ්‍රී ලංකා මානව සංවර්ධන වාර්තාව 2012

**ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය කෙරෙහි බලපා ඇති සාධක**

2009 - 2010 වසර සඳහා ගණනය කරන ලද බහුමාන දරිද්‍රතා දර්ශකයේ සංයුතිය අනුව ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශය දර්ශකය සඳහා ඉහළ ම දායකත්වයක් දක්වන අතර මේ සඳහා නිදහස් සෞඛ්‍ය සේවාවක් ක්‍රියාත්මක වීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. දර්ශකය සඳහා අවම දායකත්වයක් දක්වා ඇත්තේ විදුලි බල සැපයුම රහිත වීම හා නිවාසවල තත්ත්වයයි.

**බහුමාන දරිද්‍රතා දර්ශකය - දර්ශකාංකවල වටිනාකම**







ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරම්භය, අරමුණු, එහි වත්මන් සැකැස්ම, මුදල් ප්‍රතිපත්තිය, මූල්‍ය ක්‍රමයේ සුරක්ෂිතභාවය, මහ බැංකුවේ එක් එක් දෙපාර්තමේන්තුවල කාර්යභාරය ආදිය පිළිබඳ පැහැදිළි කිරීම්වලින් යුක්ත මාහැඟි පොත්පිංචකි.

**පහත සඳහන් ස්ථානවලින් දැන් මිල දී ගත හැකි ය.**

**මහ බැංකු ප්‍රකාශන අලෙවි කවුළුව**
ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාස කෞතුකාගාරය,
අංක 54, චැතැම් වීදිය, කොළඹ 01.
0112 444 502

බැංකු විදු පියෙස,
අංක 58, ශ්‍රී ජයවර්ධනපුර, රාජගිරිය.
0112 477 803

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.